# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
2171635
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1110 / 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 06/07/2024
පැය 0550

# මාධ්‍ය නිවේදනය

**01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - වත්තල පොලිස් ස්ථානය.**

2024.07.05 වන දින රාත්‍රී කාලයේ වත්තල පොලිස් වසමේ කදිරාන පාලම අසලදී වත්තල පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 23 මිලිග්‍රෑම් 700 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 26 ක් වන අවරකොටුව, වත්තල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

වත්තල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසය.**

2024.07.05 වන දින උදෑසන කාලයේ මිරිහාන පොලිස් වසමේ සමගි මාවත ප්‍රදේශයේදී බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර අයිස් මත්ද්‍රව්‍ය **ග්‍රෑම් 09 මිලිග්‍රෑම් 200 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන මිරිහාන පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 45 ක් වන උඩහමුල්ල, නුගේගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මිරිහාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ආදුරුප්පුවීදිය පොලිස් ස්ථානය.**

2024.07.05 වන දින සවස් කාලයේ ආදුරුප්පුවීදිය පොලිස් වසමේ කදිරේෂන් වීදිය ප්‍රදේශයේදී ආදුරුප්පුවීදිය පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද

තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 400 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 38 ක් වන කොළඹ 13 ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

ආදුරුප්පුවීදිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.

2024.07.05 වන දින රාත්‍රී කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ බොරුපන ප්‍රදේශයේදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 200 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 34 ක් වන තෙලවල, ගල්කිස්ස ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මීගමුව පොලිස් ස්ථානය.

2024.07.05 වන දින රාත්‍රී කාලයේ මීගමුව පොලිස් වසමේ තෙල්වත්ත ප්‍රදේශයේදී මීගමුව පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් ලීටර් 450 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 47 ක් වූ මිරිසන්කොටුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මීගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 06. බලපත්‍ර නොමැතිව පුපුරණ ද්‍රව්‍ය සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - හසලක පොලිස් වසම.

2024.07.05 වන දින උදෑසන කාලයේ හසලක පොලිස් වසමේ මොරයාය ප්‍රදේශයේදී හසලක පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **බලපත්‍ර නොමැතිව ඇමෝනියම් නයිට්‍රේට් කිලෝග්‍රෑම් 02 මිලිග්‍රෑම් 300 ක්, විවිධ දිගින් යුතු සේවා නූල් 05 ක් , ඩෙටනේටර් හිස් කැප් 08 සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 39 ක් වූ මොරයාය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

හසලක පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 07. හදිසි ගින්නක් - අලවතුගොඩ පොලිස් වසම.

2024.07.05 වන දින උදෑසන කාලයේදී අලවතුගොඩ පොලිස් වසමේ අකුරණ නගරයේ ප්‍රදේශයේ පිහිටි මහල් හතරකින් යුත් ගොඩනැගිල්ලක හදිසි ගින්නක්

හටගෙන ඇති බවට අලවතුගොඩ පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

මෙම ගොඩනැගිල්ලේ බේකරි නිෂ්පාදනාගාරයක් පවත්වාගෙන ගොස් ඇති අතර එහි විදුලි උදුන්වලට විදුලි සපයන පද්ධතියේ විදුලි කාන්දුවක් හේතුවෙන් මෙම ගින්න හටගෙන ඇති බවට දැනට සිදුකරන ලද විමර්ශනයට අනුව පොලිසිය සැක කරනු ලබයි. ගින්න ව්‍යාප්ත වීමෙන් එම ගොඩනැගිල්ල දෙපස පිහිටි ජාත්‍යන්තර පාසලක් හා පුද්ගලික වෙළඳ ආයතනයක් ද ගින්නට හසුව ඇත.

ගින්න හේතුවෙන් ඒ 09 මාර්ගය කටුගස්තොට ප්‍රදේශයෙන් වසා දමා විකල්ප මාර්ග ඔස්සේ වාහන ගමනාගමනය සිදුකිරීමට සලස්වා ඇති අතර අලවතුගොඩ පොලිසිය, මහනුවර සහ මාතලේ මහනගර සභාවේ ගිනි නිවන ඒකකවල නිලධාරීන් හා ප්‍රදේශවාසීන් එක්ව ගින්න මැඩපවත්වා ඇති අතර ගින්න හේතුවෙන් ජීවිත හානි කිසිවක් සිදුව නොමැත. අලවතුගොඩ පොලිසිය වැඩිදුර විමර්ශනය සිදුකරනු ලබයි.

## 08. මාරක රිය අනතුරක් - බදුල්ල පොලිස් වසම.

2024.07.05 වන දින දහවල් කාලයේ බදුල්ල පොලිස් වසමේ බදුල්ල තැන්නපංගුව මාර්ගයේ සොරනාතොට, වැලිහිඳ ප්‍රදේශයේදී තැන්නපංගුව දෙස සිට බදුල්ල දෙසට ධාවනය වූ ලොරි රථයක් බෑවුම් සහිත මාර්ගයේ තිරිංග ක්‍රියා විරහිත වීම හේතුවෙන් රියදුරුට පාලනය කරගත නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන පෙරළීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් ලොරි රථයේ රියදුරු හා එහි ගමන් කළ පුද්ගලයින් තිදෙනෙකු මියගොස් ඇත. තුවාල ලැබූ තවත් පුද්ගලයින් තිදෙනෙකු බදුල්ල රෝහලේ ප්‍රතිකාර ලබයි.

**මරණකරුවන් වයස අවුරුදු 32,40,58 හා 63 වයස් වල පසු වූ හොරොම්බුව, මොණරාගල ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මෙම ලොරි රථය මගී බස් ආවරණ සකස් කිරීමට අදාල අමුද්‍රව්‍ය හා සේවකයින් රැගෙන ගමන් කරමින් සිටියදී මෙලෙස අනතුරට ලක්ව ඇති බවට විමර්ශනයේදී අනාවරණ වී ඇත. මෘත ශරීර බදුල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර බදුල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 09. මාරක රිය අනතුරක් - බුත්තල පොලිස් වසම.

2024.07.05 වන දින රාත්‍රී කාලයේ බුත්තල පොලිස් වසමේ පැලවත්ත සීනි සමාගම තුල වලුගොල්ල මාර්ගයේ සිට කළමණාකරන නිල නිවාසවලට පැමිණෙන මාර්ගයේ සීනි සමාගම දෙසට ධාවනය වූ බවුසර් රථයක් ඇදා ඇති ට්‍රැක්ටර් රථයක ඉදිරිපස ටයරයක් මාර්ගය හරහා ජල නළ යෙදීමට සකස් කරන ලද වළකට වැටීමෙන් රියදුරු විසිවී ගොස් බිමට ඇද වැටී එම ට්‍රැක්ටර් රථයට යටවීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් රියදුරු එම ස්ථානයේදීම මියගොස් ඇති අතර ට්‍රැක්ටර් රථය මාර්ගයෙන් පිටතට ධාවනය වී නතර වී ඇත.

**මරණකරු වයස අවුරුදු 46 ක් වූ වලුගොල්ලගම, බුත්තල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මොනරාගල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. බුත්තල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 10. මාරක රිය අනතුරක් - ලුණුගම්වෙහෙර පොලිස් වසම.

2024.07.05 වන දින රාත්‍රී කාලයේ ලුණුගම්වෙහෙර පොලිස් වසමේ මොණරාගල මාතර ප්‍රධාන මාර්ගයේ දෙව්රම්වෙහෙර විහාරස්ථානය ආසන්නයේ පිහිටි පාලම අසලදී තණමල්විල දෙස සිට තිස්සමහාරාම දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක් රියදුරුට පාලනය කරගත නොහැකිව පාලම් ඇන්දේ ගැටී පෙරළීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් රියදුරු සහ ත්‍රීරෝද රථයේ පසුපස අසුනේ ගමන් කළ පුද්ගලයන් දෙදෙනෙකු එම ලුණුගම්වෙහෙර රෝහලට ඇතුළත් කිරීමේදී පසුපස අසුනේ ගමන් කළ පුද්ගලයෙකු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 37 ක් වූ මැදවත්ත, ඉමදූව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය ලුණුගම්වෙහෙර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ලුණුගම්වෙහෙර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**